# 2018 දෙසැම්බර් මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2018 දෙසැම්බර් මස මාසික සභා රැස්වීම 2018.12.13 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබිය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත්,මාධ්‍යවේදී මහතාත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2018.11.08 වන දින පැවති මාසික සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවටගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින්ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

**I.** සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයෙහි ව්‍යවසායකයන් පුහුණු කිරීම.
සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයට අදාල ව්‍යවසායකයන් පුහුණු කිරීමේ වැඩසටහනක් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ දායකත්වයෙන් සහ පළාත් සභා,පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයේ ව්‍යවසායකත්ව දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා සුදුසු ව්‍යවසායකයින් සිටී නම් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනීඅචිනි එස්. අබේවික්‍රම මැතිතුමිය අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින්,නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. කල්දීඇතියෝජනා

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

I. ගරු සභාපතිතුමා විසින් 2019 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය හා ප්‍රතිපත්ති ප්‍රකාශය ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.
මෙම ප්‍රාදේශිය සභාවට තෙවන වරටත් සභාපති වශයෙන් තේරීපත් වූ ගරු සභාපතිතුමා විසින් සිය වත්මන් සැසි වාරය තුළ ඉදිරිපත් කරනු ලබන ප්‍රථම අයවැය ලේඛනය මෙය වන බවත්,මෙම අයවැය ලේඛනය තුළින් සභා බල ප්‍රදේශය තුළ ජනතාවට මුහුණ දීමට සිදු වන ගැටලු යම් මට්ටමකට අවම කිරිමට හැකි වන පරිදි නව සේවාවන් පුළුල් කිරිමට ක්‍රමෝපායන් ඇති කිරිම එකම අභිලාෂය බවත්,ප්‍රකාශ කළේය.එමෙන්ම මෙම අයවැය ලේඛනය තුළින් පෙන්වා දෙන පරිදි පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ අදායම සියලු අරමුණු සාක්ෂාත් කර ගැනිමට තරම් ප්‍රමාණවත් නොවන බැවින් දේශිය ණය සහ සංවර්ධන අරමුදලින් දායකත්වය ලබා ගැනිමට අපේක්ෂා කරන බවද, ඒ අනුව විද්‍යුත් පුස්තකාල පහසුකම් සහිත කාර්යාල ගොඩනැගිල්ලේ දෙවන අදියර ක්‍රියාත්මක කිරිම පිණිස රු.24,900.000.00 මුදලක් ලබා ගැනිමට දැනටමත් කටයුතු සුදානම් කර හමාර බවද පැවසිය.

එමෙන්ම සභාවේ ස්වයං උත්පාදිත ආදායම ප්‍රසස්ථ මට්ටමට ගෙන ඒම සඳහා නව ආදායම් මාර්ග හඳුනාගෙන ඒවා අතුරු ව්‍යවස්ථා සම්පාදනය තුලින් නියමානුකූල කර ගනිමින් ආදායම් අය කර ගැනිමට කටයුතු කරන බවද සඳහන් කළ ගරු සභාපතිතුමා වාහන නතර කිරීම ක්‍රමවත් කිරීම

පිණිසත්, ත්‍රීරෝථ රථ සංගම් සමාජිකයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරිමට පියවර ගන්නා බවත්,ප්‍රකාශ කළේය. තවද සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සේවා අවශ්‍යතාවයන් උපරිම අයුරින් ඉටු කිරිම දුෂ්කර කාර්යක් වුවද, ඊට ප්‍රාදේශය පාලනය තුළින් දායක විය හැකි සෑම උත්සහයක්මගන්නා බවටද,විශ්වාසය පළ කළේය.සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සේවා අවශ්‍යතාවයන් උපරිම අයුරින් ඉටු කිරිම දුෂ්කර කාර්යයක් වුවද, සෞඛ්‍ය ගැටලු අවම කිරිම පිණිස දෛනිකව ජනනය වන කසළ විධිමත් ව බැහැරලීම සඳහා කාල රාමු සකසා කටයුතු කරන බවත්,කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා අක්කර 02 පර්චස් 38.8 ක භූමි ප්‍රමාණයක් අත්පත් කර ගැනිමට කටයුතු කර ඇති අතර, අදාළ ඇස්තමේන්තුව මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කර ඇති බවත් සඳහන් කරමින් ආයුර්වේද සායන ග්‍රාමීය ප්‍රදේශ වල පැවැත්විමට අවශ්‍ය ඉඩ සලසා ඇති බවද පැවසිය.තවද ග්‍රාමිය ජනතාවගේ ගමනාගමන පහසුකම් පුළුල් කිරිම පිණිස සභාව සතු JCB යන්ත්‍රය යොදවා ගැනිමට ක්‍රියා කර ඇති බවද පෙන්වා දුන් ගරු සභාපතිතුමා තවදුරටත් ජනතාවගේ යටිතල පහසුකම් දියුණු කිරිම පිණිස දැනට පවතින ජල ව්‍යාපෘති වලට අමතරව පැලැන්දකන්ද ජල යෝජනා ක්‍රමය දිර්ඝ කිරිමටත්,සුදුහීන්කන්ද ජල යෝජනා ක්‍රමය උතුරු හුණුවල ජල යෝජනා ක්‍රමයට සම්බන්ධ කර ගැනිම සහ කැන්දකැටිය ග්‍රාම නිලධාරි වසම තුළ නව ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරිම ඇතුළුව දුර්වල වී ඇති ප්‍රජා ජල ව්‍යාපෘති සක්‍රිය කිරිමට පියවර ගන්නා බවද පැවසීය.
ගරු සභාපතිතුමා විසින් තව දුරටත් සභාව අමතා පොදු වෙළඳපල පුළුල් කිරිම පිණිස තිරසාර වැඩපිලිවෙලක් දියත් කිරිම මෙන්ම, ඕපනායක නගරය තුළ ගිමන්හලක් ඉදි කිරිම හා ඕපනායක නගරය ආශ්‍රිතව ඇති ආහාර දෙපාර්තමේන්තුව භාවිතයෙන් ඉවත්කළ ගොඩනැගිල්ල ප්‍රදේශයේ ජනතාවට විවිධ සේවාවන් සපයන ස්ථානයක් ලෙස භාවිතයට ගැනිමට අපේක්ෂා කරන බවද අවධාරණය කළේය.

තවද,2019 අයවැය තුළින් පෙන්වා දෙන පරිදි සභාවේ ආදායම් වියදම් තත්ත්වය මෙසේය.

| | | | |
|---|---|---|---|
| සභාවේ උත්පාදිත ආදායම | - | රු.27,060,075.00 | |
| ආදායම් ආධාර හා වැටුප් ප්‍රතිපූර්ණ මුද්දර ගාස්තු /උසාවි දඩ | - | රු.49,082,982.00 | |
| | | | රු.76,143,057.00 |
| 2.81 සංවර්ධන ආධාර (සෞඛ්‍ය සේවා) | - | රු.20,000,000.00 | |
| 3.81 කර්මාන්ත/සංවර්ධන ආධාර | - | රු.29,920,000.00 | |
| 5.81 පොදු උපයෝගිතා සේවා | - | රු.5,000,000.00 | රු.54,920,000.00 |
| | | | රු. 131,063,057.00 |
| පුනරාවර්තන වියදම් | - | රු.65,537,861.00 | |
| ප්‍රාග්ධන වියදම | - | රු.65,343,243.00 | රු.130,881,104.00 |
| 2019/වර්ෂය අවසානයේදි අපේක්ෂිත අතිරික්තය /ඌනතාවය | | | -රු.181,953.00 |

මෙම ආදායම් සැලකිල්ලට ගෙන ප්‍රදේශයේ සියලුම කොට්ඨාශ ආවරණය වන පරිදි ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කරන බව වැඩි දුරටත් සඳහන් කළ ගරුසභාපතිතුමා මෙම සංවර්ධන කාර්යන් නොපිරිහෙලා ඉටු කිරිමේදි අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් ලබාදෙමින් එක්ව කටයුතු කරන රක්වාන ආසනයේ ප්‍රධාන සංවිධායක රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ටී.රංජිත්ද සොයිසා මැතිතුමාට සිය කෘතවේදි ප්‍රණාමය පළ කර සිටින ලදි.තවද, පරිපාලන කටයුතු වලදි අනලස්ව කටයුතු කරන සබරගමු පලාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර තැන්පත් නිලූකා ඒකනායක මැතිතුමියටත්,සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ඩී.එම්.මාලනි මැතිතුමියටත්,ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ශ්‍රියානි පද්මලතා මැතිතුමියට හා අනෙකුත් සියලුම ලේකම්තුමාලාට සහ ලේකම්තුමියලාටත් පළාත් පාලන කොමසාරිස්තුමා ,පලාත් පාලන සහකාර කොමසාරිස් තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට ස්තුතිය පල කර සිටින ලදි.

එමෙන්ම ඕපනායක හා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම්තුමන්ලා දෙපලටද එම කාර්යය මණ්ඩලයට ද ඕපනායක, වැලිගෙපොල , ගොඩකවෙල පොලිස් ස්ථානාධිපතිතුමන්ලාටද , ප්‍රදේශයේ අනෙකුත් සියලුම රාජ්‍ය ආයතන වල ප්‍රධනින්ට සහ නිලධාරින්ටද, බල ප්‍රදේශයේ බැංකු කළමණාකාර තුමන්ලාටද ස්තුතිය පල කළ ගරු සභාපතිතුමා අනතුරුව ,මෙම සභාවේ ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයටත් සිය ස්තුතිය පිරිනමා සිටිමින් සැමට ලබන්නා වූ 2019 වර්ෂය සෞභාග්‍යමත් නව වසරක් වේවා යැයි සුභාශිංසනය කරමින් 2019 වර්ෂයට අදාළ අයවැය ලේඛනයට සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කළේය.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේම කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, පහත සඳහන් ගරු මන්තුමාන්ලා හා මන්ත්‍රීතුමියන්ලා විසින් 2019 අයවැය සම්බන්ධයෙන් මෙසේ අදහස් පල කරන ලදි.

**<u>ගරු ප්‍රාදේශි සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය</u>**

පසුගිය වර්ෂයන් තුල ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට වැඩි බර තැබීමක් ප්‍රාදේශිය සභාවෙන් සිදු වී ඇති බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමිය ලබන්නා වූ නවවසරේ එය ඕපනායකට පමණක් සීමා නොවී සමස්ථ වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටම සභාවෙන් ඉටුවිය යුතු සේවාවන් නොපිරිහෙලා ඉටුකිරීමට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් 2019 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැයට සිය සුභාශිංසන පල කළාය.

**<u>ගරු ප්‍රාදේශි සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා</u>**

2019 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය වාර්තාවේ අරමුණු සාක්ෂාත් කර ගැනිමට ශක්තිය ලැබේවායැයි ප්‍රාර්ථනා කරමින් සභාව ඇමතු ගරු මන්ත්‍රීතුමා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ශ්‍රිමා මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළ ආකාරයට බල ප්‍රදේශය තුළ සමහර ගම්මාන වලට සභාවේ අනන්‍යතාවය රැක ගැනිමට තරම්වත් සේවාවක් ඉටු කිරිමට නොහැකි වි ඇති බව ප්‍රකාශ කළේය.

එමෙන්ම සභාවේ ස්වයං උත්පාදිත ආදායම් ප්‍රවර්දනය කිරිම පිණිස නව ආදායම් උත්පාදන ව්‍යාපෘති හදුනාගත යුතු බවත්,අතුරු ව්‍යවස්ථා සම්පාදනය තුළින් ඒවා නියාමනය කළ යුතු බවටත් කරුණු දැකුවු ගරු මන්ත්‍රීතුමා පෞද්ගලික පංති පවත්වන්නන්ගෙන් ව්‍යාපාර බද්දක් අයකර ගැනිම මෙන්ම

,ප්‍රදේශයේ තේ දළු එකතු කරන ව්‍යාපාරිකයින්ට බලපත්‍ර ක්‍රමයක් ඇති කිරිම කාලෝචිත ව වැදගත් වන බව පෙන්වා දුන්නේය.පසුගිය සභා වාර වලදි ඒ හා ගෙනෙන යෝජනා ද ඇතුලත් කර ඉදිරි අයවැය සම්පාදනය කල යුතුව තිබූ බව වැඩිදුරටත් සදහන් කල මන්ත්‍රිතුමා අණ පනත්, චක්‍රලේඛ වලට පමණක් සීමා නොවී ඒවා ප්‍රායෝගිකව යොදා හැකි ආකාරයට කටයුතු කිරිමේ අවශ්‍යතාවය පෙන්වා දුන්නේය.

එමෙන්ම ප්‍රදේශයේ ජන ජීවිතයට බලපෑම් කරන රෝහල්වල ගැටළු,මාර්ග ගැටළු සම්බන්ධයෙන් විසදුම් සෙවිම සඳහා ජන බලය යොදාගත යුතු බවද,ප්‍රකාශ කල ගරු මන්ත්‍රිතුමා විසින් සභාපතිතුමා ගෙන යන වැඩ පිළිවෙල තුළ හරි දේ හරිවිදියට දැකිමටත් දූර්වලතැන් මගහරවා ගෙන කටයුතු කිරිමටත් සහය ලබා දෙන බවත් පවසමින් සභාපතිතුමා විසින් ගෙන යන 2019 වසරේ වැඩ පිළිවෙල සාක්ෂාත් කර ගැනීමට ශක්තිය ධෛර්ය ලැබේවායැයි සුභාශිංසනය කළේය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එල්.ඒ. ගුණතිලක මැතිතුමා</u>

එදා මෙදා තුල මෙම ප්‍රාදේශීය සභාවට තේරීපත් වූ ගරු සභාපතිවරුන් අතරින් වැලිගෙපොල ප්‍රදේශයට වැඩ කල එකම සභාපති ලෙස වත්මන් සභාපතිතුමා පෙන්වා දිය හැකි බව ප්‍රකාශ කල ගරු මන්ත්රීතුමා 2019 අයවැය ට සහය පළ කරන බව ප්‍රකාශ කළේය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා</u>

2019 අයවැයට සුභ පතමින් සභාව ඇමතු ගරු මන්ත්‍රිතුමා , ගරු සභාපතිතුමා අපේක්ෂා කරන ආකාරයෙන්ම මෙම අයවැය ඉදිරියට ක්‍රියාත්මක කිරිමට ශක්තිය ධෛර්යය ලැබේවායැයි ප්‍රාර්ථනා කළේය.එමෙන්ම ,බල ප්‍රදේශයේ ජනතාවගේ ඕනෑඑපාකම් සොයා බලා කටයුතු කිරිමට ගරු සභාපතිතුමා දක්වන උනන්දුව හා කැපවීම අගය කළ ගරු මන්ත්‍රිතුමා ,2019 අයවැය ට සහය පළ කරන බවත්,එලෙසම වැලිගෙපොල ප්‍රාදේශිය සභාව ,ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙකකින් සමන්විත වුවද, එක් සභාවක් හැටියට ප්‍රජා අවශ්‍යතාවයන් හදුනා ගෙන කටයුතු කළ යුතු බවද අවධාරණය කලේය.එමෙන්ම ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ගුණතිලක මන්ත්‍රිතුමා අදහස් කල ආකාරයට එදාමෙදා තුර ආ ගමන් මග අවතක්සේරු නොකළ යුතු බවද, පෙන්වා දුන් ගරු මන්ත්‍රිතුමා කෙසේ වෙතත් 2019 වර්ෂයේ අයවැය ලේඛනය පෙර වර්ෂ වලට වඩා වර්ෂ අවසානයේ අපේක්ෂිත අතිරික්තය පහල මට්ටමක ඇති බැවින් සභාවේ ආර්ථික ශක්තිය වැඩි කර ගැනිමට යම් වැඩ පිළිවෙලක් සකස් කිරිමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදි.

එමෙන්ම වැඩසටහන් සම්පාදනයේදි ප්‍රාදේශිය සභා පනත අනුව මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු බවද, පෙන්වා දෙන ලදි.පොදු මහජන උපයෝගිතා වැඩසටහන් අතරට වැලිගෙපොල සති පොළ සංවර්ධනය කිරිම වසර කිහිපයකම අයවැය ලේඛනයට ඇතුළත් කර තිබුණත් මේ දක්වාම එහි ඉදි කිරිම් කළ නොහැකි වූ බව පෙන්වා දෙමින්,එසේ වුවද ගරු සභාපතිතුමා විසින් 2019 වර්ෂයට ඉදිරිපත් කරන ලද අයවැයට සහය පළ කරන බව ප්‍රකාශ කල ගරු මන්ත්‍රිතුමා මහජනතාවගේ සුභසාධනය,සුඛ විහරණය පිණිස සභාවේ කාර්යය භාර්යය ඉටු කරමින් ගමට මුහුණ දිමට හැකි පරිසරයක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියේය. අනතුරුව 2019 වර්ෂය

සැමට සුභ නව වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කළ අතරම අර්බුදකාරි තත්ත්වයන්ගෙන් තොර රටක් ආණ්ඩුවක් ඇති වේවායැයි ප්‍රාර්ථනා කළේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාව අමතමින් ,වත්මන් පාලන කාලය ආරම්භ වී ගෙවී ගිය මාස අටක කාලය තුල එතුමා විසින් සභාවට ගෙන ආ බොහොමයක් යෝජනා අතරින් එකක්වත් ඉටුකර ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කළේය.සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඇතුලත් වන ආකාරයට කුමන දේශපාලන පක්ෂයක් නියෝජනය කළද සියළුම කොට්ඨාශ වල ජනතාවට කිසියම් සේවාවක් ඉටුකිරීමේ වගකීම හැමෝටම පැවරී ඇති බැවින් ,ඒ සියළුම දෙනාට සමාන ප්‍රතිලාභ සලසා දෙන මෙන් ඉල්ලා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට සහය පළ කරන බවත්,එතුමා තෙවන වරටත් සභාපති ධූරයට පත් වූයේ එතුමා මහජනතාවට කල සෙවාව නිසා බවත් ප්‍රකාශ කල ගරු මන්ත්‍රීතුමා ,කාලෙන් කාලෙට පත් වන සභාපතිවරුන්ට ඒ ඒ කාල වලදී පවතින දේශපාලනික හා ආර්ථික තත්වය මත මහජන සේවය උපරිමයෙන් සිදු කළ බවත් ඒ අතරින් සිය පියාණන් වූ හිටපු සභාපති එච්.ඒ. විජේරත්න මැතිතුමා හා උදේනි වීරසේකර මැතිතුමන් කැපීපෙනෙන සේවාවක් ඉටුකල බව සිහිගැන්විය.සුහදශීලීව ජනතා මෙහෙවරක් ඉටුකිරීමේ අවශ්‍යතාව මත 2019 අයවැය ලේඛනයට සුභාශිංසන එක්කරමින් ලබන්නාවූ 2019 වසර සැමට සුභ නව වසරක් වේවායි! ප්‍රාර්ථනා කළේය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා**

2019 වසර සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල ප්‍රතිපත්ති ප්‍රකාශයේ ගරු මන්ත්‍රීතුමන්ලා දැක්වූ අදහස් ප්‍රයෝජනයට ගනිමින්,පවතින කුමන හෝ රජයකින් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා ගනිමින් කටයුතු ඉටුකර ගැනීමට ශක්තිය ධෛර්ය ලැබේවායි අකරැල්ල කොට්ඨාශයේ ජනතාව වෙනුවෙනුත් සිය සුභාශිංසන එක් කළේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරතන මැතිතුමා**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල ප්‍රතිපත්ති ප්‍රකාශයට සියළුදෙනා වෙනුවෙන් සිය ස්තුතිය පළ කල ගරු මන්ත්‍රීතුමා,මේ දක්වා පැමිණි ගමන් මඟේ ගරු සභාපතිතුමා විසින් බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සිදුකල මෙහෙය ආවර්ජනය කළේය.ජනතා සුභසිද්ධිය වෙනුවෙන් සභාව මඟින් සිදුකරන යහපත්දේට සහය දෙමින් අයහපත් දේ විවේචනය කරමින් මතවාද ඉදිරිපත් කරමින් සහයෝගයෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරමින් ලබන්නා වූ 2019 නව වසරට සියළු දෙනාටම සුභ නව වසරක් වේවායි !ප්‍රාර්ථනා කළේය.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති සමන් ජීවලාල් වීරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමා විසින් 2019 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අයවැය හා ප්‍රතිපත්ති ප්‍රකාශයට සුභ පතමින් සභාව ඇමතූ ගරු උප සභාපතිතුමා,එම අයවැය තුලින් අපේක්ෂිත අරමුණු හා සංවර්ධන ඉලක්ක කරා යාමට සැලසුම් සහගත වටපිටාවක් නිර්මාණය කිරීමේ භාරධූර වගකීම සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් පැවරී ඇති බව සිහිපත් කළේය.

සභාවේ නව ආදායම් උත්පාදන මාර්ගයක් වශයෙන් ඕපනායක ප්‍රදේශයට ගිමන්හලක් ස්ථාපනය කිරීම මෙන්ම ගල්පාය ප්‍රදේශයට කිරි නිෂ්පාදන ගොවිපලක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන වටපිටාව සකස් කිරීමට අවධානය යොමු කල යුතු බව අවධාරණය කලේය.එමෙන්ම වර්තමාන පාලන කාලය ආරම්භ වී මාස අටක පමණ කාලයක් ගතවූවත්,මන්ත්‍රීවරුන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති හෙයින් සභාවේ ආදායම් තත්වය වැඩිකර ගැනීමට මූලික අවධානය යොමු කල යුතු බව පෙන්වා දුන් අතර,මේ දක්වා පැමිණි ගමන් මගේ පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සහයෝගයෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් සියළුම ගරු සභික මහත්ම මහත්මීන්ට සිය ගෞරවය හා ස්තූතිය පල කරමින් සැමට සුභ නව වසරක් වේවායි !ප්‍රාර්ථනා කලේය.

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කල 2019 අයවැය කෙටුම්පත ඒකමතිකව සභා සම්මත විය.

II. හුණුවල රාජ්‍ය වතුයායෙන් ලබා ගන්නා ලද කොම්පෝස්ට් ව්‍යාපෘතියට අදාල ඉඩම හා ළමා උද්‍යාන ඉඩම මැන වෙන් කර, සීමා වැට ඉදිකිරීම හා ළමා උද්‍යානය තුල අංග සම්පූර්ණ පෙර පාසලක් ඇති කිරීම සුදුසු බවත්,

III. ඕපනායක පිහිටි ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාව ප්‍රාදේශීය සභාවට ලබා ගෙන සේවා සැපයීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ගරු සභාපතිතුමාගේ II හා III යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඕපනායක නගර මධ්‍යයේ පවතින පාසල් හා අනෙකුත් රජයේ ආයතන වලට පැමිණෙන්නන් පවතින මාර්ග තදබදය හේතුවෙන් දැඩි අපහසුතාවට ලක් වන අතර පාසල් ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටළු පවතින බව පෙන්වා දුන් ගරු සභාපතිතුමා එයට පිළියමක් ලෙස ගබඩා භූමිය භාවිතයට ගත හැකි ආකාරය පෙන්වා දෙන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමාගේ ඉහත යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

IV. 2014 වසරේ සිට වරිපනම් බදු නොගෙවීම නිසා වූ හිඟ වරිපනම් බදු කපාහැරීමට හා 2019 වර්ෂයට එම වරිපනම් බදු බිල් නොකිරීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම සභා බල ප්‍රදේශයේ 2014 වර්ෂයේ සිට දියුණු ගම් ප්‍රදේශයන් බවට හඳුනාගත් ගල්හිර පාර,හත්තැල්ල පාර,උඩවෙල පාසල් පාර,කන්දෙවිහාර පාර,මහින්දාරාම පාර,පොල්බොක්ක පාර,නව ගම්මාන පාර,තැන්නහේන පාර,කට්ටංගෙ පාර යන ප්‍රදේශවල වරිපනම් බදු ගෙවීම් විරෝධතා හේතුවෙන් 2014 වර්ෂයේ සිට අදාල වරිපනම් බදු නොගෙවීම නිසා මේ දක්වා ලේඛනගත වූ හිඟ මුදල් සහ 2018.12.31 දක්වා ලේඛන ගතවී ඇති හිඟ මුදල් ලේඛන වලින් කපා හැරීමටත්,2019 වර්ෂයට එම වරිපනම් බදු බිල් කිරීම නතර

කිරීම සඳහා වූ ඉදිරි කටයුතු සිදු කිරීමට සභා අනුමැතිය ලබා දෙන  ලෙස ගරු සභාපතිතුමා විසින් කල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

V. වර්ෂයේ මාසික සභා රැස්වීම් පවත් 2019වන දින තීරණය කර ගැනීම සහ ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනීඑන්.වී.ශ්‍රීමාවතී මැතිතුමියවිසින් ස්ථිර කරන ලදී.
2019 වර්ෂයේ මාසික සභා රැස්වීම සෑම මසකම දෙවන බ්‍රහස්පතින්දා දින යොදා ගැනීමට සියළුදෙනා තීරණය කරන ලදී.

| මාසය | | දිනය |
|---|---|---|
| 2019 | -ජනවාරි | 10 |
| | -පෙබරවාරි | 14 |
| | -මාර්තු | 14 |
| | -අප්‍රේල් | 11 |
| | - මැයි | 9 |
| | - ජූනි | 13 |
| | - ජූලි | 11 |
| | - අගෝස්තු | 8 |
| | - සැප්තැම්බර් | 12 |
| | - ඔක්තෝම්බර් | 10 |
| | - නොවැම්බර් | 14 |
| | - දෙසැම්බර් | 12 |

ඒ අනුව ඉහත සඳහන් දිනයන්හිදී මාසික සභා රැස්වීම් පැවැත්වීමට මහ සභාවේ ඒකමතික අනුමැතිය හිමි විය.

VI. 2018 භාණ්ඩසමීක්ෂණමණ්ඩලයපත්කරගැනීමඅවශ්‍ය බවත්,

VII. කාර්යාල ගොඩනැගිල්ලේ IIඅධියර ආරම්භ කිරීමත් සමඟ භාවිතයට නොගන්නා පැරණි ගොඩනැගිලි කඩා ඉවත් කිරීමටත්, එයට අවහිරවන ගස් කපා ඉවත් කිරීමටත් සභා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද VI හා VII යෝජනා ගරුඑම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමාවිසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා

VIII. මල්මීකන්ද ක්‍රීඩා සමාජය විසින් 2018.12.30 දින ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීමට සූදානම් කර ඇති බැවින්,ක්‍රීඩා පිටියේ භූමිය සකස්කර ගැනීමට JCB යන්ත්‍රය ඉල්ලා ඇති බැවින් එය ලබා දීමට සභා අනුමැතිය ඉල්ලා සිටින ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමාවිසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. මුත්තෙට්ටුපොල අක්කර 11 මාර්ගය බොරළු දමා සකසා දීම අවශ්‍ය බවත්,

II. ඕබරගල ලීකෙලිගලයාය සුසාන භූමියට අයත් භූමිය මැන වෙන් කර ගැනීම අවශ්‍ය බවත්,

III. ගල්පාය බිසෝකෝට්ටුව මාර්ගයට බොරළු දමා සකස්කර ගැනීම අවශ්‍ය බවත්,

IV. පුස්සතොට නිල්මිණී ගම මාර්ගයට බොරළු දමා සකස්කර ගැනීම අවශ්‍ය බවත්,

V. මඩවලලන්ද  කටුපිල්ලන්ද පහල කොටස මාර්ගයට බොරළු දමා සකස්කර ගැනීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමාවිසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල  මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. වතුකන්ද ප්‍රජාශාලාවට දැල් ආවරණය කිරීම අවශ්‍ය බවත්,

II. වතුකන්ද සුමනපාල මහතාගේ නිවස අසල දොල පාරට බොක්කුවක් ඉදිකිරීම අවශ්‍ය බවත්,

III. දකුණු හුණුවල පහලවෙල වෙළේවත්ත කොටසට මාර්ගය කැපීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමාවිසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා

I. බැබිල හන්දියේ ජල යෝජනා ක්‍රමයට රු.150,000.00ක P.V.C බට ලබා දීම අවශ්‍ය බව යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීමේදී එය ප්‍රජා ජල ව්‍යාපෘතියක් බැවින් ,එම ජල යෝජනා ක්‍රමය සභාවට පවරා ගැනීමට හැකියාවක් ඇතිද යන්න සොයාබලා ඉදිරිවැඩ සිදු කිරීමට තීරණය විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

## 6.1. 2018.11.08 හා 2018.11.29 වන දින පැවති මුදල් හාප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 238-302 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

## 7.1. 2018.ඔක්තෝම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය (රුපියල්) | | වැය සාරාංශය (රුපියල්) | |
|---|---|---|---|
| වරිපනම් බදු | 587,402.07 | වැටුප් හා දීමනා | 2,534,020.85 |
| කුලී | 109,983.28 | ගමන් වියදම් | 33,400.00 |
| බලපත්‍ර ගාස්තු | 12,250.00 | සැපයුම් හා උපකරණ | 390,847.00 |
| සේවා සඳහා ගාස්තු | 111,409.52 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාහා නඩත්තුව | 229,503.92 |
| වරෙන්තු ගාස්තු | 3,933.32 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 322,299.44 |
| වෙනත් ආදායම් | 27,400.02 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 387,678.96 |
| වෙනත් ආධාර | 2,180,792.50 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,033,170.71 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 16,504.92 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 3,914,255.09 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | - |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,033,170.71 | ණය ආපසු ගෙවීම් | 244,751.59 |
| සේවක ණය | 110,512.78 | සේවක ණය | - |
| තැන්පත් | 127,539.52 | තැන්පත් | 172,977.92 |
| අත්තිකාරම් | 0.00 | ණයහිමි | - |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 48,000.00 |
| වෙනත් ලැබීම් එකතුව | 238,052.30 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| | | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | |
| | | වෙනත් ගෙවීම් එකතුව | 220,977.92 |
| මුළු එකතුව | 3,271,223.01 | මුළු ගෙවීම් | 4,379,984.60 |

## 7.2. <u>2018 ඔක්තෝම්බර් 30 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා</u>

| අනු අංකය | ආදායම් ප්‍රභවය | **2017.12.31 ට හිඟ** | **2018** වර්ෂයේ ඇස්තමේන්තුගතආදායම | **2018.10.31** දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමටඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදලරු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **237851** | **5%** | **644494** | **33%** | **1295506** | 4465430 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8107** | **11%** | **5849** | **28%** | **15051** | 63035 |
| 3 | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම1.43 | | 125000 | | | **127571** | **102%** | **(2571)** | |
| 4 | ව්‍යාපාරබදු 2.16 | | 255000 | - | | **264600** | **104%** | **(9600)** | |
| 5 | වෙළෙඳබලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **824000** | **113%** | **(94000)** | - |
| 6 | පරිසරබලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **18000** | **60%** | **12000** | |
| 7 | ලියාපදිංචිසහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **138643** | **30%** | **319357** | |
| 8 | ජලගාස්තු 4.14 | 1868941 | 6075000 | 1499623 | **80%** | **3899648** | **64%** | **2175352** | 369318 |
| 9 | විකුණුම් | | 497000 | | | **161563** | | | |
| 10 | යන්ත්‍රකුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **251550** | **24%** | **798450** | |
| 11 | වාහනනැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැගිලිබලපත්‍ර3.43(4) | | 250000 | | | **107329** | **43%** | **142671** | |
| 13 | පොදුවෙළඳපලකුළී | | | | | | | | |
| 14 | මස්කඩමාළු කඩ කුළී 5.23(2) | 178393 | 428000 | 150435 | **84%** | **150500** | **35%** | **277500** | 27958 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **65428** | **59%** | **44572** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 17 | සතිපොළගාස්තු5.2 3(1) | 25880 | 254000 | 20880 | **81%** | **203370** | **80%** | **50630** | 5,000.00 |
| 18 | නිවාස කුලී | | | | | | | | |
| 19 | දැන්වීම්පුවරු ගාස්තු1.37 | | 400000 | | | **458000** | **115%** | **(58000)** | |
| 20 | ජලබවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | **103800** | **35%** | **196200** | |
| 21 | ක්‍රීඩාපිටිය කුලියට දීම 6.25 | | 2000 | | | **0** | **0%** | **2,000** | |
| **22** | වෘත්තීය බලපත්‍ර 1.33 | | **100** | | | **-** | **0%** | **100** | |
| **23** | පොලී ආයෝජන 1.61 | | **500** | | | | **0%** | **500** | |
| **24** | සේවකණය පොලී1.64 | | **40000** | | | **42006** | **105%** | **(2006)** | |
| **25** | අයකරගතහැකි ගාස්තු2.43 | | **25000** | | | **3150** | **13%** | **21850** | |
| **26** | සභාවසතු ගොඩනැගිලි3.25.1 | | **1000** | | | **1,500.00** | **150%** | **(500)** | |

| අනුඅංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගතආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙමවර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමටඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදලරු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| **27** | දඩ අනවසරඉදිකිරීම් 3.52 | | **500** | | | **-** | **-** | **500** | |
| **28** | අයකර ගත හැකි ගාස්තු 4.43 | | **1000000** | | | **793022** | **79%** | **206978** | |
| **29** | විශේෂසැපයුම් සදහා ගාස්තු4.16 | | **5000** | | | **-** | **-** | **5000** | |
| **30** | පොළභූමිය කුලියට දීම5.25 | | **1000** | | | **300.00** | **0.30** | **700** | |
| **31** | ක්‍රීඩාපිටි ටකරන් මඩු කුලියටදීම6.25 | | **2000** | | | **0** | **0%** | **2000** | |
| | **වෙනත් ආදායම්*** | **15279** | **878140** | **15279** | **100%** | **533680** | **61%** | **344460** | |
| | **මුළු එකතුව** | **6837036** | **15179140** | **1932176** | **28%** | **8798003** | **58%** | **6045700** | **4930740** |

වෙනත් ආදායම්*

| අනුඅංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙමවර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමටඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදලරු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචිකිරීමේසහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම්හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පාපැදි බලපත්‍ර 1.35 | | 150 | | | 8.00 | 5% | 142 | |
| 4 | වරිපනම්සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළිකුලියට දීම | | | | | | | | |
| 6 | කසලඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 42,000 | 39% | 65000 | - |
| 7 | සභාභූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල්පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවාගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 58000 | 29% | 142000 | |
| 10 | පුස්තකාලසේවා ගාස්තු 6.43 | | 15000 | | | 9190 | 61% | 5810 | |
| 11 | පුස්තකාලදඩ 6.52 | | 20000 | | | 3671 | 18% | 16,329 | |
| 12 | ඉඩම්විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100% | 356411 | 79% | 91979 | - |
| 14 | වෙළෙඳ ස්ථානකුලී03.22 | | 87600 | | | 64400 | 74% | 23,200.0 | |
| | එකතුව | 15279 | 878140 | 15279 | 100% | 533680 | 61% | 344460 | - |

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

පසුගිය සභා රැස්විමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බවත්, හුණුවල ප්‍රාදේශීය වතු රෝහලේ පවතින අඩු පහසුකම් පිළිබඳ සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට යොමු කල ලිපියට හා උඩවෙල විද්‍යාලයේ පවතින ගුරු පුරප්පාඩු සම්බන්ධව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට යොමුකල ලිපියට පිළිතුරු ලිපි සභාවට ඉදිරිපත් කරන ලදී.

## 9. වෙනත් කරුණු

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා සී/ස අටකලන්පන්න විවිධ සේවා සමූපකාර සමිතිය මඟින් ප්‍රාදේශීය සභාවේ ගරු සභිකයින් සඳහා සහනදායි ණය මුදලක් ලබා දෙන බවට සඳහන් කර ඇති බැවින්, ඒ පිළිබඳ සොයා බලා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සළසා දෙන ලෙස ඉල්ලා සිටින ලදී. සියළුම ගරු මන්ත්‍රීවරුන් විසින් ඒ සඳහා සිය කැමැත්ත ප්‍රකාශ කර ලදි.

පනාන මැද්දෙකන්ද විද්‍යාල භූමිය නාය යෑම් හේතුවෙන් වසා ඇති අතර එහි අයිතිය මේ වන විට ප්‍රාදේශීය ලේකම් සතුව පවතින අතර එතුමා විසින් පුද්ගලයින් කිහිපදෙනෙකුට ලබා දීමට කටයුතු කරමින් පවතින බවටත්, එයට පවුල් 70 වක පමණ විරෝධය මතු වී ඇති බවටත්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ශ්‍රීමාවතී මැතිතුමිය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් කරුණු අණාවරණය කල අතර, ඒ සම්බන්ධව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා, ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්ගෙන් සවිස්තර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කල යුතු බව සඳහන් කලේ ය.

රංවල රෝහලේ දන්ත ශෛල්‍යාගාරයට වෛද්‍ය වරයෙක් පැමිණීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමිත් විජේරත්න මැතිතුමා ගරු සභාපතිතුමාට හා ඒ සම්බන්ධව කරුණු අනාවරණ කල මාධ්‍යවේදී මහතාට සිය ස්තූතිය පලකර සිටියේය.මෙහිදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.එස්.ඉසුරුමුණි මැතිතුමා,රංවල රෝහල

ඇතුළු ප්‍රාදේශීය රෝහල් බොහොමයක වෛද්‍යවරුන් සිටියදී රෝගීන් නේවාසිකව තබා නොගෙන ගිලන්රථ මඟින් බළන්ගොඩ සහ වෙනත් රෝහල් වලට යවන බවට කරුණු අනාවරණය කළේය.

## සභා රැස්වීමේ නිමාව

2019 අයවැය සකස්කිරීමට පසුබිම සකසා ගැනීමට පසුගිය මාස 08 කාලය තුල විශාල වෙහෙසක් දැරූ බවත්,වැලිගෙපොල සතිපොල සම්බන්ධයෙන් 100% ක නීත්‍යානුකූල අයිතියක් නොමැති බැවින්, අයවැයට ඒ සඳහා ප්‍රතිපාදන ඇතුලත් නොකල බවත්,එහි අයිතිය ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදුකරන බවත්, පැවසූ ගරු සභාපතිතුමා,පසු ගිය වසර තුල පළාත් සභා ප්‍රතිපාදන නොලැබුණ බැවින් මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා ඉටුකිරීම සම්බන්ධයෙන් දුෂ්කරතා මතු වූ බවත්,2019 අයවැය තුලින් ජනතාව පිට බදු බර පැටවීමකින් තොරව වෙනත් මාර්ග වලින් ආදායම් මාර්ග ඇතිකර ගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කර ඇති අතර ඒ තුලින් ගරු මන්ත්‍රීතුමන්ලාගේ යෝජනා ඉටු කිරීමේ වැඩ පිළිවෙලක් සකසා ගත හැකි බවත්,පැවසීය.

ප්‍රාදේශීය සභාව මඟින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් යම් සේවාවක් ඉටු කිරීමට සියළුදෙනා සහයෝගයෙන් එක්ව කටයුතු කලයුතු බව පැවසූ ගරු සභාපතිතුමා අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පුදකරමින් ලබන්නා වූ 2019 නව වසරසැමට සහයෝගයෙන් වැඩ කල හැකි සුභ නව වසරක් වේවායි! ප්‍රාර්ථනා කරමින් සභාවේ කටයුතු පස්වරු 1.00ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව